# ENTREPRENEURSHIP
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ව්‍යවසායකයා

පරිසර අවස්ථා නිර්මාණශීලී ව උකහා ගෙන අවදානමක් දරමින් නවෝත්පාදන බිහි කිරීමේ නිරත වන්නා ව්‍යවසායකයෙකු ලෙස සරල ව හැඳින්විය හැකි ය.

ව්‍යවසායකයා යනු කවරෙක් දැයි හැඳින්වීමට නිශ්චිත ව පිළිගත් නිර්වචනයක් නොමැත.

ව්‍යවසායකයා සම්බන්ධ ව පහත නිර්වචනය ඉදිරිපත් කළ හැකි ය.

" වෙළෙඳපොළෙහි ඇති වන වෙනසක්ම් ව්‍යාපාර සඳහා ඇති අවස්ථාවක් ලෙස සලකන පුද්ගලයා ව්‍යවසායකයා ය. ඔහුගේ අයුධය වන්නේ නව්‍යතා සම්පාදනයයි. "

**පීටර් එෆ්. ඩ්‍රකර්**

ClassWork.LK

# ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| • තමාගේ ම අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. | • පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. |
| • ව්‍යවසායකයාගේ ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමා ම ය. | • තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත. |
| • ව්‍යවසායකයා නව ව්‍යාපාර අවස්ථා කෙරෙහි සූදානම් වෙයි. | • ව්‍යාපාරිකයා නිතර ම තමන්ගේ ව්‍යාපාර කටයුතුවල නිරත වෙයි. |
| • නවෝත්පාදකයෙකි. | • සාම්ප්‍රදායිකයෙකි. |
| • අවදානමට මුහුණ දේ. | • ආරක්ෂාකාරී ව කටයුතු කරයි. |
| • ගැටලු ඇති වූ විට ඒවා පිටු දැකීමට ධෛර්යමත් ව කටයුතු කරයි. | • ගැටලු ඇති වූ විට අධෛර්යට පත් වේ. |

ClassWork.LK

# ව්‍යවසායකත්ව ගති ලක්ෂණ

## අවදානම් දැරීමට ඇති කැමැත්ත (Willingness to take risks)

අවදානම්වලින් මගහැරීමට වඩා අවදානම්වලට මුහුණ දීමට කැමැත්තක් දක්වයි. නමුත් ඕනෑ ම අවදානමකට මුහුණදීමක් මින් අදහස් නො කෙරේ.

## නිර්මාණශීලී බව (Creativity)

වෙනස් ආකාරයකට දැකීම, සිතීම හා ක්‍රියාකිරීම

## කැපවීම (Commitment)

තම අරමුණු ඉටු වන තෙක් තමන් කරන කාර්ය දැඩි උනන්දුවකින් යුතු ව සිදු කිරීම

## ආත්ම විශ්වාසය (Self Confidence)

ව්‍යවසායකයෙකුට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වන අතර, ඒවාට සාර්ථක ව මුහුණ දී එම ගැටලු පිටු දැකීමට හැකි ය යන විශ්වාසයයි

ClassWork.LK

## <u>ස්වාධීන බව (Self-reliant)</u>

වෙනත් අයගේ අදහස් මත යැපෙන්නකු නො වී තමන්ගේ අදහස් හා හැකියා හැකිතරම් දුරට ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්තයි

ClassWork.LK

# ව්‍යවසායකත්ව කුසලතා

## නායකත්ව කුසලතා (Leadership Skills)

තමාගේ ව්‍යාපාරයේ නායකයා තමා ය. තම අනුගාමිකයින් ලවා කාර්යඉටු කරවා ගැනම සඳහා ඔවන් ධෛර්යමත් කරමින් විධිමත් ව මෙහෙයවයි.

## අන්තර්පුද්ගල හැකියා (Interpersonal Skills)

බාහිර හා අභ්‍යන්තර පාර්ශ්ව සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි.

## සන්නිවේදන කසුලතා (Communication Skills)

තොරතුරු ඔහුට සම්පතකි. අරමුණු ඉටු කර ගැනීමට මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යයි.

## මූලික කළමනාකරණ කුසලතා (Basic Management Skills)

සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීමේ හා පාලනය යන මූලික කළමනාකරණ කුසලතාවලින් යුක්ත වීම

ClassWork.LK

# ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර

## ස්වයං ඇගැයීම

පළමු ව ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිත ව හඳුනා ගෙන, එම නිපුණතා තමා තුළ කොතෙක් දුරට පවතී ද ? තමා තුළ නැති නිපුණතා මොනවා ද ? තවදුරටත් සංවර්ධනය කර ගත යුතු නිපුණතා මොනවා ද ? යන්න ස්වයං ඇගැයීමක් කිරීම

## පුහුණුව

ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඇති විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම

## අධ්‍යාපනය

සාමාන්‍ය අධ්‍යාපනයට අමතර ව, ව්‍යවසායකත්වය පිළිබඳ ව ලබන අධ්‍යාපනය

## අත්දැකීම්වලින් ඵල ලැබීම

වෙනත් ව්‍යවසායවල කටයුතු කිරීමෙන් හෝ තමා ම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම්

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura